**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වත්කමක් නොවන උතුරුවැල්ල ජල ව්‍යාපෘතියේ ජල නල එළීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දැරූ රු.159,947 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය . |
| (ආ) | 2022 වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම වෙනුවෙන් දැරූ රු.896,012 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.120,547ක්ද දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී රු. 137,762 ක් ද අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව වෙත පවරා ඇති වටිනාකම රු.403,000 ක් වූ පොදු ළිං 46 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2023 දෙසැම්බර් 31 වන දිනට ණය හිමියන් රු.156,096 කින් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.89,044 ක් වූ මූකලාන අන්දරහේන හෙවත් අඹගහමුල අත්පන්දු ක්‍රීඩා පිටිය පිහිටා ඇති ඉඩමේ වටිනාකම හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන වටිනාකම අතර රු.50,044ක වෙනසක් විය. | වැරදීමකින් සටහන් වී ඇති බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු හඳුනාගෙන අදාළ නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.6,818,990 ක් වූ පුස්තකාල 06 කට අදාළ පොත් ශේෂයන් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන ශේෂයන් අතර රු.470,827 ක වෙනසක් විය. | පුස්තකාලයාධිපතින් දැනුවත් කර නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු හඳුනාගෙන අදාළ නිවැරදි කිරීම් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ.770 (4) | ධාවනයෙන් ඉවත්කළ වාහන 04 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදුකර නොතිබුණි. | මෙම වාහන පවරා ගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර පවරාගත් පසු අපහරණ කටයුතු සිදු කරන බව. | නොපමාව අපහරණය කිරීම කටයුතු සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,317,548 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,143,743 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,574 | 4,210 | 4,214 | 7 | 2,983 | 3,428 | 3,741 | 11 |
| කුලී | 9,913 | 7,653 | 7,737 | 25 | 12,508 | 6,291 | 6,183 | 109 |
| බලපත්‍ර ගාස්තු | 1,049 | 1,070 | 1,070 | - | 1,258 | 1,007 | 1,007 | - |
| වෙනත් ආදායම් | 25,273 | 33,491 | 11,621 | 21,870 | 37,088 | 37,088 | 19,282 | 27,865 |
| එකතුව | 39,809 | 46,424 | 24,642 | 21,902 | 53,837 | 47,814 | 30,213 | 27,985 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරනැගුම බහුකාර්යය ගොඩනැගිල්ලේ උඩුමහල තක්සේරු කුලියට අඩුවෙන් බදුදීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂ 02 සඳහා රු.123,600 ක් සභාවට අහිමි වී තිබුණි. | මහ සභා අනුමැතිය අනුව වත්කම් බදු දීමේ කටයුතු සිදු කර බවත්. මහා සභා තීරණය අනුව 2024 වර්ෂය සඳහා මෙම තක්සේරු වටිනාකම ක්‍රියාත්මක කර ඇති බවත්. | නව තක්සේරුව අනුව මාසික බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු දීර්ඝ කාලීනව බදු දෙන පෙට්ටි කඩ 17 සඳහා 2023 වර්ෂයේ මාසිකව රු.1,000 බැගින් වාර්ෂිකව රු.204,000 ක වටිනාකමකට බදු දී තිබුණි. 2023 වර්ෂයේ නිකුත්කර තිබූ තක්සේරු වාර්තා අනුව උක්ත පෙට්ටි කඩ 17 සඳහා රු.525,000 ක වාර්ෂික බදු කුලියක් ලැබිය යුතු වුවත් එම තක්සේරු වාර්තාවට අනුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සභාවට රු.321,000 ක වටිනාකමක් අහිමිකර තිබුණි. | මහා සභා තීරණය අනුව 2024 වර්ෂයේ නව තක්සේරු වටිනාකම් අයකිරීමට කටයුතු කරන බව. | නව තක්සේරුව අනුව බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා රීති 61 ප්‍රකාරව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබාගත් ලැයිස්තුවේ ඇතුළත් කර්මාන්ත සියල්ල කර්මාන්ත පිළිබඳ බදු ලේඛනයට, ව්‍යාපාර බදු ලේඛනයට හා වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනයට ඇතුළත් කළයුතු වුවත් එසේ සමීක්ෂණයක් සිදු නොකර ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. | 2023 වර්ෂයේදී වාර්ෂික සමීක්ෂණය සිදු කර එම සියලු ව්‍යාපාරවලින් බදු හා ගාස්තු අය කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණයෙන් හඳුනා ගන්නා ලද සියලු කර්මාන්ත ලේඛනයට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂයේදී අලුත් කළ යුතු පරිසර ආරක්ෂක බලපත්‍ර 50 ක් අලුත් කර එම ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සභාව විසින් නොකිරීම හේතුවෙන් සභාවට පැවරී ඇති පරිසර නියාමන වගකීම පැහැරහැර තිබුණි. | අදාළ සියළු බලපත්‍ර හිමියන්ට පරිසර බලපත්‍රය අළුත් කිරීම් කටයුතු සිදු කරන ලෙසට දන්වා ඇති බව. | කාලීනව ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සභා බලප්‍රදේශය තුළ සන්නිවේදන ආයතන 06 ක් විසින් සම්ප්‍රේෂණ කුළුණු 22 ක් ස්ථාපිත කර ඇති අතර එයින් කුළුණු 08 ක් සඳහා 2021, 2022 හා 2023 වර්ෂවල අයවිය යුතු රු.72,000 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු හිමි ආයතන වලින් මෙම වර්ෂයේ දී නිසියාකාරව බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිෂ්කාශර් හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා භූමිය තුළ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවති රු.622,900 ක් වටිනාකමැති වාහන 04 ක් හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 02ක් පැවතිණි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව ධාවනය කළ නොහැකි මට්ටමේ පවතින මෙම වාහන අපහරණය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව. | ප්‍රයෝජනයට ගත හැකි වත්කම් අලුත්වැඩියා කිරීමට හා නිශ්ක්‍රීය වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ත්‍රීරෝද රථයක් 2019 වර්ෂයේදී ධාවනයෙන් ඉවත්කර අපහරණය කර තිබුණද එහි ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති අංක HD - 8236 දරණ ත්‍රීරෝද රථය 2019 සැප්තැම්බර් 12 දින ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් වෙන්දේසි කර ස්ථාවර වත්කම්වලින් ඉවත් කර ඇති බව. | සභාවේ නමට ඇති ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිගණක මිලදී ගැනීම සඳහා ආයතන 03 කින් මිල ගණන් ලැබී තිබුණු අතර අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු තෝරා ගැනීම වෙනුවට දෙවනියට අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු තෝරාගෙන පරිගණක යන්ත්‍ර 02 ක් රු.555,750 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව නොමැතිව පරිගණක තෝරාගැනීමට අදාළව අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරු ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විගණනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට කටයුතු කරන බව. | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබාගෙන ඒ අනුව මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

## 4. ගිණුම කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ව්‍යාපෘති 40 ක් ඉටුකළ යුතුව තිබුණත් ඉන් ව්‍යාපෘති 17 ක් පමණක් ඉටුකර තිබුණි. ඉටු නොකළ ව්‍යාපෘති හා ඒ සඳහා වාර්ෂික අයවැය මඟින් රු.37,092,800 ක ප්‍රතිපාදන සලසා තිබුණි. | ඉටු නොකළ ව්‍යාපෘති වෙනුවෙන් අයවැය මඟින් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ප්‍රතිපාදන නොලැබීම හා අපේක්ෂිත ආදායම් නොලැබීම නිසා අනෙකුත් ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව සභාවේ කටයුතු මෙහෙයවීමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ අයවැයගත ප්‍රතිපාදන සලසා නොමැති ව්‍යාපෘති 09 ක් ඉටුකර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණත් මහ සභා තීරණයන්ට අනුව මෙම ව්‍යාපෘති සිදු කර ඇති බව. | ඵලදායී කළමනාකරණ මෙවලමක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කර ගත යුතුය. |